# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2358/70 - 2023 නොවැම්බර් මස 17 වැනි සිකුරාදා - 2023.11.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 3/2021 (III)

**2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත**

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 71 වන වගන්තිය යටතේ, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව සහ අදාළ නියාමන අධිකාරීන් විමසා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**රනිල් වික්‍රමසිංහ,**
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2023 නොවැම්බර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2023 ජුනි මස 02 වැනි දින අංක 2334/47 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2023 අංක 1 දරන කොළඹ වරාය නගරය (සංවර්ධන පාලන) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ නියෝගවල II වන කොටසේ (සැලසුම්) 39 වන නියෝගයේ උප-ශීර්ෂයේ, "**ඒකාබද්ධ කිරීම**" යන වචන වෙනුවට "**ඒකාබද්ධ කිරීම සහ අනුබෙදීම**" වන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ නියෝගවල 39 වන නියෝගයට ඉක්බිතිව ම, ඒ නියෝගවල 39අ වන නියෝගය ලෙස බලාත්මක විය යුතු පහත දැක්වෙන අලුත් නියෝගය ඇතුළත් කිරීමෙන් :-

"**39අ.** සංවර්ධන කාර්යයන් සඳහා බිම් කැබැල්ලක් අනු කොටස්වලට බෙදනු ලැබිය හැකි ය. බිම් කැබිලි අනුබෙදීම අනුමතයට යටත් විය යුතු ය.";

1A - PG 6553 — 366 (2023/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(3) ඒ නියෝගවල 47 වන නියෝගයේ -

(අ) ඒ නියෝගයේ වගුව 3.1 (භූමි පරිහරණයේ ව්‍යාප්තිය) හි -

(i) ඒ වගුවේ "උසස් අධ්‍යාපනය" යන භූමි පරිහරණය නිරූපණයවන පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන පේළිය ආදේශ කිරීමෙන් :-

| | | | |
|---|---|---|---|
| "උසස් අධ්‍යාපනය | 24,263.7 | 0.90% | උසස් අධ්‍යාපනය ආශ්‍රිත සංවර්ධනය" |

(ii) ඒ වගුවේ "සංස්කෘතික හා සෞඛ්‍ය" යන භූමි පරිහරණය නිරූපණයවන පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන පේළිය ආදේශ කිරීමෙන් :-

| | | | |
|---|---|---|---|
| "සංස්කෘතික හා සෞඛ්‍ය | 76,175.1 | 2.83% | "සම්මන්ත්‍රණ මධ්‍යස්ථානය, රෝහල, සෞඛ්‍ය සේවා ආශ්‍රිත සංවර්ධනය" |

(iii) ඒ වගුවේ "විවෘත අවකාශ (උද්‍යාන සහ චතුරස්‍ර)" යන භූමි පරිහරණය නිරූපණයවන පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන පේළිය ආදේශ කිරීමෙන් :-

| | | | |
|---|---|---|---|
| "විවෘත අවකාශ (උද්‍යාන සහ චතුරස්‍ර) | 242,461.9 | 9.00% | පොදු භාවිතය - කුඩා පරිමාණ වාණිජ කටයුතු සහ රථ වාහන නැවතුම් පහසුකම් සහිත උද්‍යානය සහ විවෘත අවකාශය" |

(iv) ඒ වගුවේ "විවෘත අවකාශ (උද්‍යාන සහ චතුරස්‍ර)" යන භූමි පරිහරණය නිරූපණයවන පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් පේළිය ඇතුළත් කිරීමෙන් :-

| | | | |
|---|---|---|---|
| "ක්‍රීඩා පහසුකම් | 26,304.2 | 0.98% | පොදු භාවිතය - කුඩා පරිමාණ වාණිජ කටයුතු සහ රථ වාහන නැවතුම් පහසුකම් සහිත ක්‍රීඩා පහසුකම්" |

(v) ඒ වගුවේ "විවෘත අවකාශ (දිය දිසි)" යන භූමි පරිහරණය නිරූපණයවන පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන පේළිය ආදේශ කිරීමෙන් :-

| | | | |
|---|---|---|---|
| "විවෘත අවකාශය (දිය දිසි) | 97,071.5 | 3.60% | පොදු භාවිතය - ඇළ මාර්ග සහ ජලතීර මත අවසරලත් කුඩා පරිමාණ වාණිජ ක්‍රියාකාරකම් සහිත විවෘත අවකාශය" |

(ආ) ඒ නියෝගයේ භූමි පරිහරණ සැළසුම් නිරූපණයවන රූප සටහන 3.1 ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන රූප සටහන ආදේශ කිරීමෙන් :-




රූප සටහන 3.1 භූමි පරිහරණ සැලසුම්"

(4) ඒ නියෝගවල 48 වන නියෝගයේ වගුව 3.2 (බිම් කැබලිවලට අදාළ පරාමිතීන් සහිත වගුව) හි -

(අ) ඒ වගුවේ "1-S-02" දරන බිම් කැබලි කේතයට අදාළ පේළිය ඉක්බිතිව ම පහළින් ඇති "1-W-01" දරන බිම් කැබලි කේතයට අදාළ පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන පේළිය ආදේශ කිරීමෙන් :-

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| "1-W-00 | විවෘත අවකාශය (ජලාභිමුඛ) | 2714.21 | - | - | - | - | - | -"; |

(ආ) ඒ වගුවේ "2-SF-04" දරන බිම් කැබලි කේතයට අදාළ පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන පේළිය ආදේශ කිරීමෙන් :-

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| "2-SF-01 | ක්‍රීඩා පහසුකම් | 26,304.20 | - | - | - | - | -" |

(ඇ) ඒ වගුවේ "3-01-05" දරන බිම් කැබලි කේතයට අදාළ පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන පේළිය ආදේශ කිරීමෙන් :-

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| "3-01-05 | උසස් අධ්‍යාපන | 24,263.71 | 4.50 | 109,186.70 | 60% | 120m | 25% | 15%" |

(ඈ) ඒ වගුවේ "3-01-06" දරන බිම් කැබලි කේතයට අදාළ පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන පේළිය ආදේශ කිරීමෙන් :-

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| "3-01-06 | සංස්කෘතික හා සෞඛ්‍ය සේවා | 24,146.40 | 4.00 | 96,585.60 | 50% | 150m | 40% | 10%" |

(5) ඒ නියෝගවල 55 වන නියෝගයේ ඇති වගුවේ (වාණිජ කලාපයේ භූමි පරිහරණය) හි "1.1 අනුමත භාවිතයන්" යන අයිතමය දැක්වෙන පේළියේ "කාර්යාල :" යන උපශීර්ෂය යටතේ "අවම වශයෙන් මුළු දළ ගෙබිම් ප්‍රමාණයෙන් 70% ක් විය යුතු බිම් කැබිලි : 1-01-04, 1-01-08, 1-01-11, 1-01-12, 3-01-02, 3-01-06, 3-01-07, 3-02-09, 3-02-10;" යන වචන සහ ඉලක්කම් ඉවත් කිරීමෙන්;

(6) ඒ නියෝගවල 58 වන නියෝගයේ ඇති වගුවේ (අධ්‍යාපන/උසස් අධ්‍යාපන කලාපයේ භූමි පරිහරණය) -

(අ) ඒ වගුවේ "3.2 වේදිකා ගොඩනැගිල්ලේ (Podium) උපරිම උස" දැක්වෙන පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන පේළිය ආදේශ කිරීමෙන් :-

| | | |
|---|---|---|
| "3.2 වේදිකා ගොඩනැගිල්ලේ (Podium) උපරිම උස | 3-01-05 | බිම් කැබැල්ල : වේදිකා ගොඩනැගිල්ල (Podium) සඳහා අවසරලත් උපරිම උස බිම් කැබැල්ලට ප්‍රවේශවන ස්ථානයේ සිට මීටර් 25.0 ක් විය යුතු ය. |
| | 3-01-04 | බිම් කැබැල්ල : අදාළ නොවේ." |

(ආ) ඒ වගුවේ "4.2 පතුල්මහල් සඳහාවන විවෘත ඉඩකඩ" දැක්වෙන පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන පේළිය ආදේශ කිරීමෙන් :-

| | |
|---|---|
| "4.2 පතුල්මහල් සඳහාවන විවෘත ඉඩකඩ | • බිම් කැබලිවල පොදු සීමාවන් ඔස්සේ : මීටර් 0<br>• බිම් කැබැල්ලේ මාර්ගයකට මුහුණලන සීමාව ඔස්සේ : මීටර් 3.0" |

(ඇ) ඒ වගුවේ "4.3 කලුණු සඳහාවන ඉඩකඩ" දැක්වෙන පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන පේළිය ආදේශ කිරීමෙන් :-

| | |
|---|---|
| "4.3 කලුණු සඳහාවන ඉඩකඩ | • 3-01-04 බිම් කැබැල්ල : අදාළ නොවේ<br><br>• 3-01-05 බිම් කැබැල්ල : වේදිකාවේ සිට අවම වශයෙන් මීටර් 6.0" |

(7) ඒ නියෝගවල 61 වන නියෝගයේ ඇති වගුවේ (සංස්කෘතික හා සෞඛ්‍ය කටයුතු සඳහා වෙන් කරන ලද ඉඩම් පිළිබඳ භූමි පරිහරණය) -

(අ) ඒ වගුවේ "1.1 අනුමත භාවිතයන්" යන අයිතමය දැක්වෙන පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන පේළිය ආදේශ කිරීමෙන් :-

| | |
|---|---|
| "1.1 අනුමත භාවිතයන් | • රෝහල් :<br><br>3-01-06 බිම් කැබැල්ලඃ අවම වශයෙන් මුළු දළ ගෙබිම් ප්‍රමාණයෙන් 60% ක් විය යුතු ය.<br><br>• සම්මේලන/ප්‍රදර්ශන මධ්‍යස්ථානයඃ<br><br>3-01-09 බිම් කැබැල්ලඃ අවම වශයෙන් මුළු දළ ගෙබිම් ප්‍රමාණයෙන් 60% ක් විය යුතු ය.<br><br>* අවසරලත් අනුපූරක භාවිතයන් සඳහා භාවිතයන් පිළිබඳ න්‍යාසය බලන්න." |

(ආ) ඒ වගුවේ "2.4 මෘදු භූ දර්ශන ප්‍රදේශ සහ රෝපණය කරන ලද ප්‍රදේශවල ප්‍රමාණය" යන අයිතමය දැක්වෙන පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන පේළිය ආදේශ කිරීමෙන් :-

| | |
|---|---|
| "2.4 මෘදු භූ දර්ශන ප්‍රදේශ සහ රෝපණය කරන ලද ප්‍රදේශවල ප්‍රමාණය | 3-01-06 බිම් කැබැල්ල :<br><br>• බිම් මහලෙහි මට්ටමේ දී මෘදු/රෝපණය කළ ප්‍රදේශ භූමිය පුරා ඇති මුළු භූ දර්ශන ප්‍රදේශවලින් අවම වශයෙන් 30% ක් විය යුතු ය.<br><br>• අනෙකුත් මහල්වල මට්ටම්වල දී මෘදු භූ දර්ශන ප්‍රදේශ එම මහලේ සමස්ත භූ දර්ශන ප්‍රදේශයෙන් අවම වශයෙන් 20% ක් විය යුතු ය.<br><br>3-01-09 බිම් කැබැල්ල :<br><br>• බිම් මහලෙ හි මට්ටමේ දී මෘදු/රෝපණය කළ ප්‍රදේශ භූමිය පුරා ඇති මුළු භූ දර්ශන ප්‍රදේශවලින් අවම වශයෙන් 30% ක් විය යුතු ය.<br><br>• අනෙකුත් මහල්වල මට්ටම්වල දී මෘදු භූ දර්ශන ප්‍රදේශ එම මහලේ සමස්ත භූ දර්ශන ප්‍රදේශයෙන් අවම වශයෙන් 30% ක් විය යුතු ය." |

(ඇ) ඒ වගුවේ "3.2 වේදිකා ගොඩනැගිල්ලේ (Podium) උපරිම උස" දැක්වෙන පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන පේළිය ආදේශ කිරීමෙන් :-

| | |
|---|---|
| "3.2 වේදිකා ගොඩනැගිල්ලේ (Podium) උපරිම උස | 3-01-06 බිම් කැබැල්ල :<br><br>බිම් කැබැල්ලට ප්‍රවේශවන ස්ථානයේ සිට මීටර් 25.0 ක් විය යුතු ය.<br><br>3-01-09 බිම් කැබැල්ල : අදාළ නොවේ." |

(8) ඒ නියෝගවල 80 වන නියෝගයේ ඇති වගුවේ (බිම් කැබිලි සංවර්ධන පාලන - භූ දර්ශනය), "2.3 වහල භූ දර්ශනය" දැක්වෙන පේළිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන පේළිය ආදේශ කිරීමෙන් :-

| | |
|---|---|
| "2.3 වහල භූ දර්ශනය | • බහු මහල් රථගාලේ පිහිටන පියසි උයන, පදිංචිකරුවන්ගේ සුවපහසුකම් සම්බන්ධ අවශ්‍යතාවයන්ට ප්‍රතිචාරාත්මක වන්නා වූ, සංවර්ධය තුළ පවතින විවෘත අවකාශවල දිගුවක් ලෙස භූ දර්ශනය කරනු ලැබිය යුතු ය.<br>• බිම් කැබිලි 3-01-04 සහ 03-01-05 : පියසි උයන සෘජුවම අධ්‍යාපනික වටිනාකමක් ආශ්‍රිත ද්‍රව්‍ය සැපයීම සඳහා සකස් කරනු ලැබිය යුතු ය." |

EOG 11 - 0191

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.